# <u>මොරටුව විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු</u>

මෙම විශ්වවිද්‍යාලයේ **වෛද්‍ය පීඨයේ** පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ විශ්වවිද්‍යාලවල හා ඊට අනුබද්ධ උසස් අධ්‍යාපන ආයතනයන්හි **තනතුරෙහි තහවුරු කරන ලද ස්ථිර සේවකයින්ගෙන් පමණක්** අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව සකස් කළ අයදුම්පත් හා අදාළ ලේඛන තමා සේවය කරන ආයතනයේ ලේකම්/ලේඛකාධිකාරී//මණ්ඩපාධිපති/අධ්‍යක්ෂ මගින් **2024.04.26 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් මොරටුව විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරී/ ආයතන (අනධ්‍යයන) වෙත ලැබීමට සැලැස්විය යුතුය. අයදුම්පත් බාර ගන්නා අවසාන දිනට පසු ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**<u>වෛද්‍ය පීඨය</u>**

**<u>තාක්ෂණික නිලධාරී - 11 ශ්‍රේණිය "අ" බණ්ඩය තනතුර</u>**

**අවශ්‍ය සුදුසුකම්** :

(I) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සම්මාන සාමාර්ථ 05ක් සහිතව විෂයයන් 06කින් සමත් වී තිබීම. (සම්මාන සාමාර්ථ ලබාගත් විෂයන් අතරට විද්‍යාව හා ගණිතය යන විෂයන් ඇතුළත් විය යුතුය.)

හෝ

(II) තෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විද්‍යාව සහ ගණිතය විෂයයන් ඇතුළුව විෂයයන් 06කින් සමත්ව තිබීම සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක වර්ෂ 08ක සතුටුදායක ස්ථිර සේවා කාලයක් තිබීම.

හෝ

(III) උසස් අධ්‍යාපන ආයතනයක විද්‍යාගාර සහායකයකු වශයෙන් වසර 15 ක ස්ථිර සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**<u>සටහන:</u>** බඳවා ගනු ලබන තැනැත්තන් ප්‍රථමයෙන් අවුරුදු 03 ක පුහුණුවීමේ කාලසීමාවකට යටත්ව "පුහුණුවන තාක්ෂණික නිලධාරී" වශයෙන් පත් කරනු ලැබේ. පුහුණුවීමේ කාලය අවසන් වීමෙන් පසු විද්‍යාගාර කටයුතු පිළිබඳ නිපුණත්වය, බඩු ඇණවුම් කිරීම, තොග භාණ්ඩ පවත්වාගෙන යාම සහ ඉංග්‍රීසි භාෂාවෙන් යතුරු ලිවීම පිළිබඳ ප්‍රවීණත්වයක් ලබාගත් සේවක භවතුන් සේවයේ ස්ථිර කර "11 ශ්‍රේණියේ "අ" බණ්ඩයේ" තාක්ෂණික නිලධාරී තනතුරට පත් කරනු ලැබේ.

**වැටුප් ක්‍රමය**: රු. 31,625-7x300;10x355-37,275/-p.m. (මාසික)-U-MT1 (III A)

ආයතන චක්‍රලේඛ ලිපි අංක 06/2020 අනුව විශ්වවිද්‍යාල පද්ධතිය තුළ තනතුරකින් වෙනත් තනතුරකට පත්කිරීමේදී රජයේ ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 09 වන වගන්තියට අනුව අදල වැටුපෙහි පිහිටවනු ලැබේ.

**බඳවා ගන්නා ක්‍රමය** : යෝග්‍යතා පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

ලේඛකාධිකාරී
මොරටුව විශ්වවිද්‍යාලය
මොරටුව
2024.03.28